SLECIC

# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ:

**1). කණිෂ්ඨ කළමනාකරු (අලෙවිකරණ)** JM **1-2** (II **ශ්‍රේණිය) – තනතුරු 01**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය, වාණිජ හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත්වී තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ 'කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන' (MA1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**2). කනිෂ්ඨ කළමනාකරු (තොරතුරු තාක්ෂණ)** JM **1-2** (II **ශ්‍රේණිය) – තනතුරු 01**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1හෝ 2හෝ 3 හෝ 4)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් ලබා තිබීම.
2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 7 ට නොඅඩු වෘත්තීය ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
3. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 6 ට නොඅඩු වෘත්තීය ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම,

   සහ

   සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් තිබීම.
4. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ට නොඅඩු වෘත්තීය ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම,

   සහ

   සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර දහයක (10) සේවා පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

- ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**වැටුප** : JM 1-2 රු. [74,010 - 10X1,360 - 18X2,040 - 124,330] (2025/01 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛයට අනුව 2027.01.01 දිනට හිමිවන ආරම්භක වැටුප – රු. 74,010/-) + ජීවන වියදම් දීමනාව + KPI දිරිදීමනා + වෛද්‍ය ප්‍රතිලාභ සහ චක්‍රලේඛ ප්‍රකාරව අනුමත අනෙකුත් දීමනා.

**සාමාන්‍ය කොන්දේසි**

සෑම අයදුම්කරුවෙකුම,

- ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මනාව ඉටු කිරීම සඳහා කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් නිල වෙබ් අඩවියට (https://www.slecic.lk/) පිවිස ඉහත තනතුරු පිළිබඳ විස්තරාත්මක තොරතුරු ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිනු ලැබේ.රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින් තම අයදුම්පත්, තමන් තේරී පත් වුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බවට වන සඳහන ද ඇතුළත්ව අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.

ඉහත තනතුරු සඳහා වන අයදුම්පත්, අදාළ සහතික පත්‍රවල ඡායා පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර ද සහිතව ලියාපදිංචි තැපෑලෙන් "සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 4 වන මහල, NDB-EDB කුලුන, නො. 42, නවම් මාවත, කොළඹ 02" යන ලිපිනයට 2026 නොවැම්බර් 02 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED